උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 9

මං විශ්ව විද්‍යාලයට ගියේ ක්ෂුද්‍ර ජීව විද්‍යාව හදාරන්න. ඒත් මගේ හිත දිව්වෙම සිනමාව හොයාගෙන. මං ඉරාන චිත්‍රපටි බලන්න පුරුදු වුණේ විශ්ව විද්‍යාලයෙදි.අපි දෙවෙනි වසරෙ අවසානෙ ඇතුලෙ ඉන්දුවා.

"පිස්සෙක් වෙන්නෙපා බං.උඹට අපි කොච්චර කිව්වද ඒ කෙල්ල එක්ක ඔය ගැන කථා

වැහිලා ලෝකෙම මොහොතකට අඳුරු වුණා.ඒ අන්ධකාරය ඇතුලෙ දුලිනිගෙ අහිංසක මූණ පුරා කඳුළු වැල් ගලා යන ක්ෂණික සිහිනයක් මං දැක්කා.ඒ උදේ පාන්දර මං වතුර මල යටට වෙලා සෑහෙන වෙලාවක් හිටියා.කරාමෙන් වතුර වෑස්සෙන තරමටම මගේ ඇස් දෙකෙන් කඳුළු පිටාර ගැලුවා.මං දුලිනිට එච්චර ආදරේ කළ බව මං වත් දැන ගෙන හිටියෙ නැහැ.

දුලිනි බැන්දෙ සසංකව නෙවේ වෙන කෙනෙක්ව නං මගේ හිතේ මේ තරං පසුතැවීමක් ඇතිනොවෙන්න තිබුණා. ඒත් සසංකගෙයි චත්‍රාගෙයි සම්බන්ධෙ දුරදිග ගිය තරම මං හොඳටම දන්න නිසා ඒ පසුතැවීම වේදනාවක් බවට පත්වුණා. සසංක චත්‍රාව බැන්දෙ නැහැ.චත්‍රා දැන් බොරැල්ලේ පොඩි තට්ටු නිවාසෙක දරුවත් එක්ක තනියම ජීවත්වෙන බව මං දන්නවා.ආර්තී චත්‍රා එක්ක මිත්‍ර සමාගමක් පැවැත්වුවෙ නැති වුණාට එයාට

තිබුණෙ. ඒත් මංගලී කපුවො ලව්වා සසංකට හොඳ තැනකින් යෝජනා හෙව්වා.හොඳ දෑවැද්දක් එක්ක අහිංසක ගෑණු ළමයෙක්ව පුතාට හොයලා දෙන්න ඕනෙ කියන තැන මංගලී ඉඳලා තිබුණා.මොකද වලව්ව සින්න වෙනවට මංගලී කැමති වුණේ නැහැ.තමන්ගෙ භාරයේ වලව්ව තියාගැනීමේ මානසිකත්වයක මංගලී හිටියෙ.මුලින් ගෙදරට රෙද්ද හැට්ටෙ ඇඳපු මංගලී පස්සෙ පස්සෙ සාරි අඳින්න ගත්තා. අන්තිමට උඩරට ඔසරිය ගෙදරට අඳින්න ගත්තා.ඉස්සර දවසක අපේ අම්මා ආර්තීව එක්කන් එන්න එහෙ යද්දි මංගලී අපේ පුංචිගෙ ඔසරියක් ඇඳගෙන වත්තෙ වැඩකලු.අපේ අම්මට බොහොම කේනිති ගිහිං තිබුණා ඒ ගැන.සියදෝරිස් කියන විදියට "ලොකු මැණිකෙට උගුරු පුවල් නැගලා මංගලී ට හොඳ දෙකක් කිව්වා" කියලා අපිට දැනගන්න ලැබුණෙ.

එදා අපේ අම්මා ගෙදර ඇවිත් බොහොම වේදනාවෙන් ඇඬුවා.අපේ පවුලෙ හැමෝම විශේෂයෙන්ම මාමලා එදා හවස අපේ ගෙදරට පිරුණා.ආර්තී හොඳටම බයවෙලා බලන් හිටියා. අපේ අයියා ආර්තීව වඩාගෙන වත්ත පහලට ගියා.

## මගේ මල්ලිත් අප්පච්චිගෙ පාරෙම යන්නයි හදන්නෙ.



ඉඳිද්දි තමා දුලිනිලගෙ කණ්ඩායම ඇතුලත් වුණේ. දුලිනි ආවෙ භාෂා අංශයට. ඇය ප්‍රංශ, ඉංග්‍රීසි සහ ආර්ථික විද්‍යාව ඉගෙන ගන්න බව මං දැනගත්තෙ කණිෂ්ඨයෙක්ගෙන්. මේ වෙද්දි ආර්තියි මායි බොහෝ දුරට නිදහස් ජීවිත ලබල තිබුණා.අපි එකතුවෙලා හොඳ චිත්‍රපටි බලන්න ගියා. නාට්‍ය බලන්න ගියා.මගෙ මිතුරන් වගේම ආර්තිගෙ මිතුරොත් එකතු වෙලා චිත්‍රපටි ගැන කථා කරන්න පටන්ගත්තා. පස්සෙ කාලෙක මගේ නිර්මාණ වල ප්‍රබලම විචාරිකාව වුණේ ආර්ති. එයා ඒවා ගැන ඉංග්‍රීසි පත්තර වලට ලිව්වා. ඒ ලිපි තමයි පස්සෙ කාලෙක නිර්මාණ කරුවෙක් වශයෙන් මාව ගොඩනැගුවෙ.මං දුලිනි ගැන මගෙ හිතේ ඇතිවෙච්ච හැම ආදරණීය හැඟීමක්ම මගේ හැම හීනයක්ම කිව්වෙ ආර්ති එක්ක. ආර්ති හැම වෙලේම කිව්වෙ "ඉක්මනට ඕක ඔය කෙල්ලගෙන් අහන්න. නැත්තං අන්තිමට කොහෙවත් ඉන්න එකෙක් ඔය කෙල්ලව අරං යයි" කියලා. අන්තිමට වුණොත් ඒක.දුලිනි බැන්දෙ සසංකව කියලා මං දැනගත්තෙ ආර්තී අරං ආපු පින්තූරෙකින්. මගේ මුළු ලෝකෙම එක පාරටම එක තැනක නැවතුණා. මට හිතුණෙ මගෙ හදවත ගැහෙන එක නවතියි කියලා. මං දෑතින් ඔළුව බදාගෙන පුටුවක වාඩිවුණා මට මතකයි.

සසංකගෙ මඟුල් ගෙදරට අපිට ආරාධනා ලැබුණෙ නැහැ.

"ඒකත් එකට බොරු ලෝකයක් කියලා ඇති මනමාලිගෙ පාර්ශවේට.ඒකනෙ අපිව එතනට ගෙන්න්න බය. පව් ඒ අහිංසක කෙල්ල. බැලූ බැල්මට අපේ ගංගා වගේ මට පේන්නෙ. හරිම සීදේවි පාටයි"
අම්මා හරිම හැඟිම්බර වුණා ඒ පින්තූර ටික බලලා.

එදා රෑ තමයි මගේ ජීවිතේ මං වැඩිපුරම බිව්වෙ.නිල්හාන් ඇවිත් මාව වත්තන් කරගෙන යනකං මං වෙරළ අයිනෙ අපේ පුරුදු අවන්හලේ මදුවිතත් එක්ක තනිවෙලා හිටියෙ. පුදුම අසරණකමක් මට දැනුණෙ. නිල්හාන් මාව මෝටර්රිය



උපේක්ෂා සේනානායක
ලියයි



අතුල උපසිරි කල්දෙමුල්ල ගේ
සිතුවමින්

කරන්න කියලා. නැත්තං අම්මලාට කියලා අහන්න කියලා.උඹ ඒ එකක්වත් නොකර අවශ්‍ය දේ මග ඇරිය නං දැන් බොරුවට පිස්සු කෙලින්න එපා."

එදා රෑ මං හිටියෙ නිල්හාන්ගෙ පුංචි කාමරේ.උදේ පාන්දර ඇහැරුණාම මට පුදුම අපුලක් මං ගැනම දැනුණා.නිල්හාන් මට බැන බැනම උණු බිත්තර කෝපි එකක් හදලා දුන්නා.

"මචං ඉඳුවර දැන් බැහැලම උඹේ ෆිල්ම් එක ගැන හිතපං.උඹට හොඳ මාර්කට් එකක් තියෙනවා.දැන් හොඳ බර කාරයෙකුත් සෙට්වෙලානෙ ඉන්නෙ.ෆිල්ම් එක ගොඩ දා ගනිං.අද නේද කාස්ටින් ඩිරෙක්ටර්ව හම්බෙන්න තියෙන්නෙ. ලෑස්ති වෙයං යන්න."

නිල්හාන් අසභ්‍ය වචනෙකුත් කියලා තුවායක් මගෙ ඇඟට විසිකරා.තුවායෙන් මගෙ ඔළුව

අනුකම්පා කරා. චත්‍රා ස්වභාවයෙන්ම පමණට වඩා හිතුවක්කාර චරිතයක්.මංගලී චත්‍රා ට කැමති වුණේම නැහැ.හේතුව එයා යමක් කමක් තියෙන පවුලක ගෑණු ළමයෙක් නොවීම.මංගලී කියනවට පිටින් සසංක තීරණ ගන්නෙ නැහැ කියන එක ඇත්තක්.සසංක දන්නවා අද එයා ඉන්න තත්ත්වයට එයාව ගේන්න මංගලී වින්ද අප්‍රමාණ දුක.චත්‍රා වෘත්තියෙන් හෙදියක්.සසංක වෛද්‍ය විද්‍යාලයෙන් පිටවෙලා රෝහල් සේවයට බැඳෙද්දිත් චත්‍රා හෙදියක් විදියට වසර කිහිපයක පලපුරුද්දක් ලබල තිබුණෙ. හෙදි විදුහලේ ඉවත් වුණ කාලෙම චත්‍රා එයාගෙ පවුලෙන් ඈත්වෙලා තනියම කුලී ගෙදරක ඉන්න පටන් අරන් තිබුණා.සසංක ඒ ගෙදරට නිතර ආවා ගියා. ආර්තී ඒ ගැන කථා කරේ ලොකු කලකිරීමකින්.

"මගේ මල්ලිත් අප්පච්චිගෙ පාරෙම යන්නයි හදන්නෙ. මට දුක ඒකයි"

මංගලී මේ දේවල් නතර කරන්න විශේෂ වෑයමක් දරන්නෙ නැති බව අපිට තේරුං ගිහිං

ඒ සිදුවීම් කොහොම සිදුවුණත් මංගලීගෙ වලව්ව පිළිබඳව තිබුණු අමුතු ආදරය සහ බලෙන් ඇතිකරගන්න වෑයම් දරන වලව් මානසිකත්වය නතර කරන්න කාටවත්ම බැරිවුණා. ඒ හැමදේකින්ම අවසානයේ විඳවන්න වුණේ දුලිනිට.

දුලිනිට දරුවෙක් ලැබෙන්න ඉඳලා ඒ දරුවා නැතිවුණ බව ආර්ති මට දැනුංදෙනකොට මං හිටියෙ ඇමෙරිකානු තානාපති කාර්යාලයේ. අමුතුවෙන් ඇතිවෙන්නවත් නැතිවෙන්නවත් දෙයක් නැති තරමට මානසිකව ඔද්දල් වෙලා හිටිය මං ඒ දේවල් ඔහේ දරාගන්න ඇති කියලා මට දැං හිතෙනවා.ඇත්තටම ඇතැම් දේවල් මට හීනයක් වගේ.

අප්පච්චි මාව ඇමරිකාවට යවලා සිනමාකරණය උගන්වන්න තීරණය කළේ මගේ පලවෙනි කෙටි චිත්‍රපටිය නරඹලා ගෙදර ආපු දවසෙලු. දුලිනි ගෙ විවාහය සිදුවෙච්ච අවධියෙ මං මගේ මුළු කාලයම කැප කරලා මගේ පලවෙනි කෙටි චිත්‍රපටිය කළා.ඒ වෙද්දි වාර්ථා චිත්‍රපටි කිහිපයක් කරලා මං කිසියම් නමක් හදාගෙන හිටියෙ ක්ෂේත්‍රය තුල.

**මතු සම්බන්ධයි**